# රට ගොඩනගන්නට එක්වෙයි



වසර සියගණනක් තිස්සේ ගොඩනැගුනු මාතර පුරවරය සුනාමි ව්‍යසනයෙන් විනාශවිය. නමුත් මෙම රට සංවර්ධනය කළයුතුයි. මේ නිසාම මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ජනමාධ්‍ය ඇමැති මංගල සමරවීර මහතා සියලු නිලධාරීන් කැඳවා නිරන්තරයෙන් සාකච්ඡා පවත්වා ජනතාවගේ අවශ්‍යතා ඉටුකරලයි. විනාශ වූ රට ගොඩනැගීමේදී පක්ෂ, පාට, භේද ඔළුවේ තබාගෙන එම කාර්යය කළ නොහැකියි. එහිදී අවශ්‍ය වෙන්නේ මේ අපේ රට, අපේ ජනතාව යන පොදු හැඟීමයි. තොබෝද ඇමැති මංගල සමරවීර මහතා ප්‍රධාන කොටගෙන පැවැති සාකච්ඡාවකට කොළඹ දිස්ත්‍රික් එ. ජා. ප. පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් යාපා මහතාද පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමියෝද, දකුණු පළාත් සභා ජ.වි.පෙ. මන්ත්‍රී සිසිර කුමාර මහතා ද එක්වූයේ මේ අරමුණ ඇතිවයි. පක්ෂ පාට භේදයෙන් තොරව එද ඔවුන් සාකච්ඡා කෙළේ මේ රට ප්‍රතිනිර්මාණය කරනා අයුරුයි.